**ශීර්ෂය 09 - පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය , එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 10 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 07 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අධිකාරයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කර ගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි.වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- අධිකාරයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිත භාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම් අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම . |
|---|---|---|---|
| (අ) | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ තැන්පතු ගෙවීම් වශයෙන් රු.45,584 ක් දක්වා ඇතත් ඒසීඒ -4 ආකෘතියෙහි තැන්පතු පිළිබඳ කිසිදු සටහනක් දක්වා නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව හා නිවැරදි දත්ත ඇතුළත් කර මූල්‍ය ප්‍රකාශ පිළියෙල කළ යුතුවේ. | අධිකාරය විසින් තැන්පතු ගිණුමක් පවත්වාගෙන යනු නොලබන අතර මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ තැන්පත් ගෙවීම් ලෙස රු.45,584 ක් දක්වා ඇත්තේ වැටුප් රහිත නිවාඩු අයකර ගැනීමකි.ඉදිරි ගිණුම් ඉදිරිපත් කිරීම් වලදී නිවැරදිව ඉදිරිපත් කිරීමට සටහන් කර ගතිමි. |
| (ආ) | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ආදායම් නොවන ලැබීම් යටතේ රු.611,400 ක් වූ අත්තිකාරම් ලැබීම් දක්වා නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුවේ. | නිරීක්ෂණය පිළිගනිමි. |
| (ඇ) | වෙනත් ලැබීම් යටතේ දැක්විය යුතු රු.438,428 ක් දක්වා නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුවේ. | ඉදිරි ගිණුම් ඉදිරිපත් කිරීමේදී එපරිදි කටයුතු කිරීමට සටහන් කර ගතිමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ආදායම් නොවන ලැබීම් ලෙස වෙනත් ලැබීම් යටතේ දැක්විය යුතු රු.197,800 ක් ආදායම් ලැබීම් යටතේ බදු නොවන ආදායම් හා වෙනත් ලෙස දක්වා තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුවේ. | නිරීක්ෂණය පිළිගනිමි. |

## 1.6.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම.** |
|---|---|---|
| මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දේපළ පිරියත හා උපකරණ ශේෂය රු.652,512 ක් අඩුවෙන් දක්වා තිබුණි.එම වටිනාකමින්ම දේපළ පිරියත හා උපකරණ සංචිතයද අඩුවෙන් දක්වා තිබුණි. | දේපළ පිරියත හා උපකරණ ශේෂය නිවැරදිව දැක්විය යුතුවේ. | ප්‍රමාද දෝෂයකින් ශේෂය අඩුවෙන් දක්වා ඇත.ඉදිරියේදී එය නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ඇත. |

## 1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | | |
|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් යටතේ ආදායම් නොවන ලැබීම් වටිනාකම් දක්වා නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුවේ. | නිරීක්ෂණය පිළිගනිමි. |

## 1.6.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය<br>නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | **2002 අංක 04 දරන පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය පනතේ 9(1) ඡේදය** | අධිකාරයේ සභාපතිවරයා, පත්කල නිලධාරීන් 05 දෙනකුගේ සේවා කාලය අවසන් වීමෙන් පසු අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් විමසීමකින් තොරව කොන්ත්‍රාත් පදනමින් වෙනත් නිලධාරීන් අදාළ නිලධාරීන් සඳහා පත් කර තිබුණි. | අධිකරණ සේවා කොමිෂන් සභාව විමසා අවශ්‍ය නිලධරයන් හා සේවකයින් පත්කළ යුතුවේ. | නිලධාරීන් බඳවා ගැනීමේදී සෑම විටම අධිකරණ සේවා කොමිෂන් සභාව වෙතින් විමසා බඳවා ගැනීම් සිදු කරන ලදී. |
| (ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ**<br>**මුදල් රෙගුලාසි 138(6)** | 2019 ජූලි මස ආරක්ෂක සේවය සපයා ගැනීම වෙනුවෙන් හා සනීපාරක්ෂක සේවය සපයා ගැනීම වෙනුවෙන් රු. 107,920 ක් ගෙවීමේදී සේවාව සැපයූ නිලධාරීන්ගේ පැමිණීමේ ලේඛන ගෙවීම් වවුචරයට අමුණා නොතිබුණි. | මුදල් රෙගුලාසි 138(6) ප්‍රකාරව සහතික යනාදිය අඩංගු ලිපිගොනු පිළිබඳ යොමු සඳහන්,ගෙවීම් වවුචරයෙහි යෙදිය යුතුවේ. | නිරීක්ෂණය පිළිගනිමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** <br> **-----------------------------** | | | |
| | **(i) 2019** අප්‍රේල් 16 **දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛය** | නිලධාරීන්ගේ කාර්යාලයට පැමිණීම පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සළකුණු යන්ත්‍ර භාවිතා කර නොතිබුණි. | 2019 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඇඟිලි සළකුණු යන්ත්‍රය අක්‍රිය වී තිබීම හේතුවෙන් එය අලුත්වැඩියා කර සවි කිරීමට කටයුතු කළ අතර 2020 අප්‍රේල් මස 01 දින සිට භාවිත කිරීමට සැලැසුම් කර තිබුණි.එහෙත් කොවිඩ් 19 වෛරසය නිසා ඇඳිරිනීතිය ක්‍රියාත්මක වීම හා ආයතනය වසා දැමීම හේතුවෙන් මෙතෙක් භාවිතයට ගත නොහැකි විය. |
| | **(ii) 2018 පෙබරවාරි 20 දිනැති අංක 03/2018 දරන චක්‍රලේඛයේ 02 ඡේදය** | වසර 02කට වැඩි කාලයක සිට තනතුරු 3ක් සඳහා නිලධාරීන් තිදෙනෙකුද, තනතුරු 4ක් සඳහා වසර 5කට වැඩි කාලයක සිට නිලධාරීන් 4 දෙනෙකුද වශයෙන් විශ්‍රාමික නිලධාරීන් 7 දෙනකු සේවයේ යොදවා තිබුණි. | 2018 පෙබරවාරි 20 දිනැති අංක 03/2018 දරන චක්‍රලේඛයේ 02 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | නිලධාරින් බඳවා ගැනීම පිළිබඳ බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කර ගැනීමට හා තනතුරු අනුමත කරවා ගැනීමට කටයුතු කෙරෙමින් පවතී.එතෙක් කටයුතු අඛණ්ඩව කර ගෙන යාමට විශ්‍රාමික නිලධාරින්ගේ සහය ලබා ගැනීමට සිදුවුණි. |
| (ඈ) | **2019 දෙසැම්බර් 04 දිනැති අංක 07/2019 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 04 ඡේදය** | කාර්යාල උපකරණ මිලදී ගැනීම අත්හිටුවා ඇති අවස්ථාවක කාර්යාල උපකරණ මිලදී ගෙන තිබුණි. | 2019 දෙසැම්බර් 04 දිනැති අංක 07/2019 දරන චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | භාණ්ඩාගාරයෙන් ලිඛිතව මුදල් ඉල්ලා සිටි අතර එම මුදල් අධිකාරයට ලැබුණි.ඒ අනුව උපකරණ 3 ක් මිලදී ගත් අතර මහා භාණ්ඩාගාරයෙන් ඊට කිසිදු විරෝධතාවයක් ඉදිරිපත් නොවුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අංක 2002 දරන යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වැය විෂයයේ රු.250,000ක් වූ මුළු ඇස්තමේන්තු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුවේ. | අභ්‍යන්තර දුරකථන පද්ධතියක් ස්ථාපිත කිරීමට ප්‍රතිපාදන වෙන් කර ගත්තද ශ්‍රී ලංකා ටෙලිකොම් වෙතින් එය ඉටු කර ගැනීමට නොහැකි වීම නිසා ප්‍රතිපාදන ඉතිරි විය. |

## 3 මෙහෙයුම් සමාලෝචනය

## 3.1 ප්‍රසම්පාදනයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සේවා ගිවිසුම් කාලය අවසන් වීමට පෙර ප්‍රසම්පාදන ක්‍රමවේද අනුගමනය කර නිසි කලට වේලාවට සේවා සැපයීම සඳහා ආයතන තෝරාගෙන නොතිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 (අ) ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී මෙවැනි තත්වයක් ඇති නොවීම සඳහා කටයුතු කිරීමට සටහන් කර ඇත. |

## 4. මානව සම්පත් කළමනාකරණය

අධිකාරය විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව 2019 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු දෙකම කොන්ත්‍රාත් පදනමින් පුරවා තිබුණු අතර තෘතිය මට්ටමේ තනතුරු 4න් තනතුරු 3ක්ද, ද්වීතීයික මට්ටමේ තනතුරු 3 ක්ද,ප්‍රාථමික මට්ටමේ තනතුරු 2ක් ද, කොන්ත්‍රාත් පදනමින් පුරවා තිබුණි.මේ අනුව අනුමත තනතුරු 31න් තනතුරු 20ක්ම පුරප්පාඩු පැවති අතර එම පුරප්පාඩු පිරවීමට සමාලෝචිත වර්ෂය අවසාන වන තෙක් කටයුතු කර නොතිබුණි.